# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,326 - 2023 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2023.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 102 |


*සැ. යු.* - (i) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, 2023 මාර්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත 2023 මාර්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 අප්‍රේල් මස 21 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අප්‍රේල් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ප්‍රභාෂී චාරුන්දි විදානපතිරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.07.12 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගා/9/ප්‍ර 15470 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පෝද්දල, නරාවල මුලනහේන පදිංචි පෝද්දිවෙල මාරගේ පේමවති වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී/4 145 යටතේ 1995.02.16 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2023.04.21** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර පත්තුවේ/කෝරලයේ 111 f මුලන නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නරාවල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 90/3/2 ඕ 18/36-37 දරන ක්ෂේත්‍ර පත්‍රයේ/ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මූ. පි. ගා. 2506 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 23 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.044 ක් විශාලත්වයක් ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම්වූ ද රජයේ ඉඩම, මුලනහේන .

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 11, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 09, |
| *දකුණට* | : | කැබලි අංක 09, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 22 සහ 13. |

ප්‍රභාෂී සී විදානපතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ පෝද්දල.

2022 දෙසැම්බර් මස 30 වැනි දින

03 - 944/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් බන්දුල ප්‍රීතිරාජ් අබේසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994 ඔක්තෝබර් මස 31 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගා/6/ප්‍ර 15961 එල් එල් 4025 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගෝනගලපුර බෙන්තොට පදිංචි කණහැර ආරච්චිගේ ඒමිස්සිංඤෝ මයා වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 583 යටතේ 1995.05.29 වැනි දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.04.21** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙන්තර වලල්ලාවිට කෝරළේ බටහිර අංක 11 ඊ, කොළණිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගල්තුඩුව නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක මූ. පි. ගා. 2476 දරන පිඹුරෙහි අංක 40 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.283 ක් ඇතැයි ගණන් බලා තිබෙන තුන්හවුලේ ගොඩකැලේ යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 41 සහ මූ. පී. ඒ. 550 කැබලි අංක 12 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 38, |
| *දකුණට* | : | කැබලි අංක 37, |
| *බස්නාහිරට* | : | මූ. පී. ඒ. 550 කැබලි අංක 12. |

බී. පී. අබේසේකර,
ප්‍රාදේශීය ලේකම්,
බෙන්තොට.

2022 නොවැම්බර් මස 15 වැනි දින,

03 - 944/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥා නත යටතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් බන්දුල ප්‍රීතිරාජ් අබේසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥපනතේ 19(4) උපවග න්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1992 ජුනි 09 වැනි දින ප්‍රදනය කර ඇති අංක ගා/6/ප්‍ර 13822 එල් එල් 103635 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඕබඩවත්ත බෙන්තොට පදිංචි ලේස්තුරුගේ ආතර් ප්‍රනාන්දු වෙත ප්‍රදනය කොට බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 387 යටතේ 1992.10.27 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.04.21** දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙන්තර වලල්ලාවිට කෝරළේ බටහිර අංක 03 බී, සිංහරූපාගම (කලින් යාත්‍රාමුල්ල) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඕබඩවත්ත නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක මු. පි. ගා. 2215 දරන පිඹුරෙහි අංක 65 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.066 ක් ඇතැයි ගණන් බලා තිබෙන මද්දෙවෙල යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම සැලැස්මේ අංක 57 සහ 66, |
| *නැගෙනහිරට* | : | මෙම සැලැස්මේ අංක 57 සහ 66 හා 67, |
| *දකුණට* | : | මෙම සැලැස්මේ අංක 63, 66 සහ 67, |
| *බස්නාහිරට* | : | මෙම සැලැස්මේ අංක 63 සහ 64. |

බී. පී. අබේසේකර,
ප්‍රාදේශීය ලේකම්,
බෙන්තොට.

2022 මැයි මස 17 වැනි දින,

03 - 944/3

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70695.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : CPC/LC/LD/4/1/32/1104.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 534, කඳපොල ග්‍රාම නිලධාරි වසමේ, කඳපොළ ගමේ අංක නුඑ/3/2/1/2/කඳපොළ/98 දරන අනුරේඛනයෙහි කැබලි අංක 01න් දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.00286 (වර්ග අඩි 308) ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා නාවුරුන්න ගුරුගේ අමරලතා මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | NU/NEW/2020/65 අනුරේඛනයෙ හි කැබලි අංක C හි ඉතිරි කොටස සහ කැබලි අංක D, |
| *නැගෙනහිරට* | : | NU/NEW/2020/65 අනුරේඛනයෙහි කැබලි අංක D සහ මාර්ග රක්ෂිතය, |
| *දකුණට* | : | මාර්ග රක්ෂිතය සහ NU/NEW/ 2020/65 අනුරේඛනයෙහි කැබලි අංක B, |
| *බටහිරට* | : | NU/NEW/2020/65 අනුරේඛනයෙහි කැබලි අංක B සහ C හි ඉතිරි කොටස . |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.02.24 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.*- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට

(රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(ඊ)* 2023.02.24 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු දීම් කළ නොහැක.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ආර්. මෙත්මා රණසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මාර්තු මස 20 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-1027

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/72792.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/L-10/LS/TRI/MUT/30.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිලිවෙඩ්ඩි 218 ඒ ග්‍රාම නිලධාරී වසමේ, කිලිවෙඩ්ඩි ගමේ අංක 0946 දරන අනුරේඛනයෙහි කැබලි අක්ෂර ඒ දරන ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 30.67 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා කන්දයියා සුයලක්ෂ්මි මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

කැබලි අංක ඒ හි මායිම් :

*උතුරට* : වී චන්ද්‍රමෝකන් විසින් අල්ලා ගෙන ඇති එෆ්. ටී. පී. 7 පිඹුරේ කැබලි අංක 3113 සහ ත්‍රිකුණාමලය මඩකලපුව ඒ 15 මාර්ගය (RAD),

*නැගෙනහිරට* : ත්‍රිකුණාමලය මඩකලපුව ඒ 15 මාර්ගය (RAD) සහ කන්දන් කුලන්තයිවේලු විසින් අල්ලා ගෙන ඇති එෆ්. ටී.පී. 7 පිඹුරේ කැබලි අංක 3114,

*දකුණට* : කන්දන් කුලන්තයිවේලු විසින් අල්ලා ගෙන ඇති එෆ්. ටී. පී. 7 පිඹුරේ කැබලි අංක 3114 සහ පී. විනයාගමූර්ති විසින් අල්ලා ගෙන ඇති 3112,

*බටහිරට* : වී. චන්ද්‍රමෝකන් විසින් අල්ලා ගෙන ඇති එෆ්. ටී. පී. 7 පිඹුරේ කැබලි අංක 3113 සහ පී. විනයාගමූර්ති විසින් අල්ලා ගෙන ඇති 3112.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.03.01 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.*- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර

එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(ඊ)* 2023.03.01 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ,

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ආර්. මෙත්මා රණසිංහ,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මාර්තු මස 10 වැනි දින,<br>
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,<br>
''මිහිකත මැදුර'',<br>
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-927